# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,875/1 — 1969 ඔක්තෝබර් 11 වැනි සෙනසුරාදා — 1969.10.11**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# IV වැනි කොටස—පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### ගම්සභා ආඥපනත

**17 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

1961 කේ අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥ පනතේ (257 වැනි අධිකාරයේ) 17 (5) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර, මහනුවර පළාත් පාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලියනු මුදියන්සේලාගේ සමරසිංහ වන මා විසින්, මීට යාකොට ඇති උපලේඛනයේ I වැනි තීරුවෙන් නියමිත ගම්සභාවේ රැස්වීම එකී උප ලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත දිනයෙහිදීද, එකී උපලේඛනයේ III වැනි තීරුවේ අනුරූප සටහනින් නියමිත වේලාවේදීද, එකී උප ලේඛනයේ IV තීරුවෙන් නියමිත ස්ථානයේදීද, මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ලි. මු. සමරසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්, මහනුවර පාලන දිස්ත්‍රික්කය.

1969 ඔක්තෝබර් මස 7 වැනි දින,
පළාත් පාලන අමාත්‍යාංශයේ මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේදීය.

### උපලේඛනය

| I වැනි තීරුව ගම්සභාවේ නම | II වැනි තීරුව දිනය | III වැනි තීරුව වේලාව | IV වැනි තීරුව ස්ථානය |
|---|---|---|---|
| ගහපලාත දකුණ, උඩුනුවර | ... 1969.10.19 | ... ප.ව. 3.30 | ... උඩුනුවර ගහපලාත දකුණ ගම්සභා කාර්යාලය, ගෙලිඔය. |

10–789


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

සැ. යු.—14,874/1 කාණ්ඩයේ අවසාන අති විශෙෂ ගැසට් අංකය 14,874/7 ය.

1A—ජේ 6920—5,225 (69/10)